# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1809/6 - 2013 මැයි මස 06 වැනි සඳුදා - 2013.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

#### අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ (ඌ) ජේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල අංක 06 දරන රථවාහන නවතා තැබීම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම පරිච්ඡින්න කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක නොවන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය
හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 පෙබරවාරි මස 17 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*කුලීරථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. මෙම අතුරු ව්‍යවස්ථා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම පාලනය කිරීම විධිමත් කිරීම, සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමුවැනි උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණු ඇතිව නවතා තැබීම නොකළ යුතු ය.

3. මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉහත 2 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථාන වල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට මාසිකව ගෙවීමෙන් ඒකී ස්ථානවල කුලී රථ වාහන නවතා තැබීම කළ යුතු අතර එම කුලී රථ වාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය.

4. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථ වාහන නැවතුම්පළවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

6. බලපත්‍රය ලබා ගැනීම සඳහා තුන්වැනි උපලේඛනයේ ප්‍රකාරව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

7. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස රථ වාහන පාලකවරයකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. සෑම මසකම පළමුවැනි දිනට පෙර අදාල මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබා ගෙන තිබිය යුතු ය.

9. මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම් පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ගැනීමට පෙර වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළහොත් අදාල මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලී රථ වාහන නැවතුම්පොළ තුළදී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයකු ලවා සේදීමට සැලැස්වීම හෝ හිරිහැරයක් වනසේ ක්‍රියා නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හැසිරීම හෝ හිරිහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝණය නොකඩවා තව දුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසු හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝණය තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය දෙවන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ/හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාව" යන්නෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති " යන්නෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද

"රථ වාහන පාලක" යන්නෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් රථ වාහන පාලනය කිරීම සඳහා පත් කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් අදහස් කෙරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයේ අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

**උපලේඛනය 01**

01. පහළ තැන්නේකුඹුරෙ කුලීරථ නැවතුම්පළ
02. හාරගම බස්නැවතුම්පළ අසල කුලීරථ නැවතුම්පළ
03. සිල්වා මෝටර්ස්, තැන්නේකුඹුර කුලීරථ නැවතුම්පළ
04. තේක්කවත්ත හන්දිය අසළ කුලීරථ නැවතුම්පළ
05. අම්පිටිය දිවුරුම් බෝධිය අසල කුලීරථ නැවතුම්පළ
06. අම්පිටිය 3 කණුව හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
07. පිච්චමල්වත්ත හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
08. හාරගම හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
09. ගුරුදෙණිය හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
10. මහකන්ද හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
11. පැණිදෙණිය ඉන්ධන පිරවුම්හල අසල කුලීරථ නැවතුම්පළ
12. ගුරුදෙණිය දඹවෙල හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
13. ලෙව්ල කොස්හින්න හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
14. ඇල්හේන හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
15. මැද්දේපතන හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
16. ජයලංකා හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
17. සෙමනේරිය හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
18. උඩුවෙල පාර හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
19. හිඳගල හන්දිය අසල කුලීරථ නැවතුම්පළ
20. පේරාදෙණිය ගම්පළ බස් නැවතුම්පල අසල කුලීරථ නැවතුම්පළ
21. කොළඹ පාර බෝ ගහ අසල කුලීරථ නැවතුම්පළ
22. අම්පිටිය මැද්දේගම 10 කණුව අසල කුලීරථ නැවතුම්පළ
23. හිරැස්සගල අසල කුලීරථ නැවතුම්පළ
24. බෝවලවත්ත පිට්ටනිය අසල කුලීරථ නැවතුම්පළ
25. සරසවිගම අසල කුලීරථ නැවතුම්පළ
26. ඔගස්ටාවත්ත ශ්‍රී සුගතාරාම විහාරස්ථාන පිවිසුම අසළ (බෙන්තර හන්දිය) කුලීරථ නැවතුම්පළ
27. උඩපේරාදෙණිය ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල කුලීරථ නැවතුම්පළ
28. ඉලුක්මෝදර තලපියන්නාව පාරට හැරෙන හන්දිය අසල කුලීරථ නැවතුම්පළ

**උපලේඛන අංක 02**

| | | *ගාස්තු ප්‍රමාණය මසකට*<br>*රු. ශ.* |
|---|---|---|
| 01. | ලොරියක් සඳහා | 200 0 |
| 02. | වෑන් රථයක් සඳහා | 200 0 |
| 03. | ත්‍රීරෝද රථයක් සඳහා | 100 0 |
| 04. | ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් සඳහා | 150 0 |
| 05. | කාරයක් සඳහා | 125 0 |
| 06. | අත් ට්‍රැක්ටරයක් සඳහා | 100 0 |
| 07. | ට්‍රක් රථයක් සඳහා | 200 0 |

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

කුලීරථ බලපත්‍රය සඳහා අයදුම්පත්‍රය

01. වාහනයේ අංකය හා වර්ගය :..........................................................................................

02. අයිතිකරුගේ නම :..........................................................................................................

03. හැඳුනුම්පත් අංකය :.......................................................................................................

04. ලිපිනය :.......................................................................................................................

05. රියදුරුගේ නම :............................................................................................................

06. රියදුරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................................

07. රියදුරු බලපත් අංකය :...................................................................................................

08. ලිපිනය :.......................................................................................................................

09. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය :.......................................................................

10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යයක් සඳහා ද ? මගී ප්‍රවාහනය ☐ භාණ්ඩ ප්‍රවාහනය ☐
(✓ ලකුණ යොදන්න)

11. එහි ධාරිතාව හා ප්‍රමාණය :..............................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කර සිටින අතර කුලීරථ ගාලේ වාහනය ගාල් කර තබන විට හා ප්‍රදේශයේ ධාවනය කරන විටත් ප්‍රාදේශීය සභාවට අපකීර්තියක් නොවන පරිදි විනයානුකූලව කටයුතු කිරීමටත් ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග වලට එකඟව කටයුතු කිරීමටත් මෙහි පහතින් අත්සන් තබමින් එකඟ වෙමි.

......................
අයිතිකරු/රියදුරු අත්සන.

දිනය :.....................

සභාපතිගේ නිර්දේශය :.....................

දිනය :.....................

......................
සභාපති.

05 - 512

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.